www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ දෙමල පුවත්පතකට එරෙහිව වර්ගවාදී ප්‍රහාරයක්

## Racist attacks on Tamil newspaper in Sri Lanka

**අපේ වාර්තාකරුවකු විසිනි**
**2005 සැප්තැම්බර් 3**

අගෝස්තු 12 දා ශ්‍රී ලංකාවේ විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය කිරීමෙන් ඉක්බිතිව කොලඹ මාධ්‍ය සහ දේශපාලන පක්ෂ, වාර්ගික ආතතීන්ගෙන් හා භීතියෙන් යුත් වාතාවරනයක් අවුලුවා තිබේ. මෙම දේශපාලන වාතාවරනය තුල, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට හිතවත් දෙමල පුවත්පතක් වන සුඩර් ඔලි පත්‍රයට එරෙහිව ප්‍රචන්ඩ ශාරීරික ප්‍රහාර මාලාවක් එල්ල කර ඇත.

අගෝස්තු 29 දා සන්ධ්‍යාවේ, නාඳුනන මැරයන් දෙදෙනෙක් කොලඹ ග්‍රෑන්ඩ්පාස්හි පිහිටි පුවත්පතේ කර්තෘ මන්ඩල කාර්යාලයට අත් බෝම්බ දෙකක් දමා ගැසී ය. සිවු දෙනෙක් ඉන් තුවාල ලැබී ය. සුඩර් ඔලි මගින් සේවයේ යොදවන ලද ආරක්ෂක භටයකු වූ 60 හැවිරිදි ඩේවිඩ් සෙල්වරත්නම් පසුව රෝහලේ දී මිය ගියේ ය. අනෙක් තිදෙනා ද පුවත් පත වෙනුවෙන් සේවය කල අය යි. ප්‍රහාරකයන් මුලින් උත්සාහ කලේ, කර්තෘ කාර්ය මන්ඩලය සිටින ගොඩනැගිල්ලේ ඉහල මාලයට ඇතුලු වීමට යි. එහෙත් ආරක්ෂක භටයා විසින් ඔවුහු වලකාලන ලදි. අත් බෝම්බය දමා ගැසීමෙන් අනතුරුව ඔවුහු යතුරු පැදියකින් පලා ගියහ.

අත් බෝම්බ ප්‍රහාරය එල්ල වූයේ ඊට පෙර සිදු වූ සිද්ධීන් මාලාවකට පසුව ය. අගොස්තු 20 දා, දකුනු කොලඹ වැල්ලවත්තේ පිහිටි සුඩර් ඔලි ශාඛා කාර්යාලයක් තුලට අත් බෝම්බයක් විසි කරන ලදි. එම අවස්ථාවේ එහි සිටි සේවකයන් තිදෙනා තුවාල නොලබා ගැලවුනේ අත් බෝම්බය නොපිපිරුනු නිසා ම පමනි.

ඉන් තෙදිනකට පසුව, අගෝස්තු 23 දා, සුඩර් ඔලි පත්‍රයේ සේවය කරන දෙමල මාධ්‍යවේදියකු වන ප්‍රේමචන්ද්‍රන් යදූර්ෂන්, කොලඹ කොටුව දුම්රිය පොල ඉදිරිපිට පැවැති ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) විරෝධතා උද්ඝෝෂනයක් වාර්තා කරමින් සිටිය දී, ජවිපෙ සාමාජිකයන් විසින් ඔහුට ශාරීරිකව පහර දෙන ලදි. ජවිපෙ කල්ලිය ඔහුගේ ඩිජිටල් කැමරාව, ජංගම දුරකතනය සහ මුදල් මෙන් ම, සුඩර් ඔලි වාර්තාකරුවකු ලෙස ඔහුගේ පත්වීමේ ලිපිය හා සෙසු ලියකියවිලි ද උදුරා ගති.

තමා මාධ්‍යවේදියකු බවට ඔහු ඉදිරිපත් කල විරෝධතා නො තකා, යදූර්ෂන් අනතුරුව "එල්ටීටීඊ සැකකරුවකු" ලෙස පොලීසියට භාර දෙන ලදි. ඔහුට පහර දුන් මැරයන්ට එරෙහිව කටයුතු කරනවා වෙනුවට, පොලීසිය ජවිපෙ පැත්ත ගෙන වාර්තාකරු අත් අඩංගුවට ගත්තේ ය. රුපියල් 7,500ක ශරීර ඇප මත පසු දින ඔහු නිදහස් කරන ලදි. එය වනාහි සාමාන්‍ය කම්කරුවකුගේ මාසික වැටුපට සමාන මුදලකි. ඔහුගේ පුද්ගලික බඩු භාන්ඩ ආපසු භාර දී නැත.

ජවිපෙ සිය විරෝධතාව කැඳවා තිබුනේ, කදිරගාමර් ඝාතනය සම්බන්ධයෙන් එල්ටීටීඊය හෙලා දැකීම සහ ආන්ඩුව වඩා ආක්‍රමනික පියවර ගත යුතු බව ඉල්ලා සිටීම පිනිස ය. පොලීසිය හා ආරක්ෂක හමුදා ඇතුලුව, ඝාතනය සම්බන්ධයෙන් එල්ටීටීඊයට දොස් පැවරූ කිසිවෙක්, කිසිදු නිශ්චිත සාක්ෂියක් ඉදිරිපත් කොට නැත. තථ්‍ය වසයෙන් ගත් කල, එල්ටීටීඊය මත වරද පැටවීමේ සහ හිර වී ඇති "සාම ක්‍රියාදාමය" යලි ඇරඹීමට ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග දැරූ දෙගිඩියා සහගත ප්‍රයත්නයන් කඩාකප්පල් කිරීමේ අභිප්‍රායෙන් යුක්තව සිංහල අන්තවාදීන් විසින් මෙම කුමන්ත්‍රනය සංවිධානය කරනු ලැබීමට බෙහෙවින් ඉඩ ඇත.

සුඩර් ඔලි පුවත්පතට සහ එහි මාධ්‍යවේදීන්ට එල්ල වූ මෑත ම ප්‍රහාරයන් මගින් තහවුරු වන්නේ, ප්‍රචන්ඩ විධික්‍රමයන්ගේ පිහිට සෙවීමට එවන් සිංහල අන්තවාදී තට්ටුවල පවත්නා සූදානම යි. අත් බෝම්බ විසි කලේ කවුරුන් ද යන වග පැහැදිලිව තහවුරු වී නැති වුවත්, පැහැදිලි සැකය එල්ල වන්නේ, ජවිපෙ හා ජාතික හෙල උරුමය වැනි ස්වෝත්තමවාදී පක්ෂ සහ මිලිටරි සංස්ථාපිතයේ සිටින ඔවුන්ගේ සම-චින්තක කොටස් වෙත ය. මෙම කව තුල, ඕනෑ ම දෙමල ජාතිකයෙක් "එල්ටීටීඊ සැකකරුවකු" ලෙස ද එහෙයින් ප්‍රචන්ඩ ප්‍රහාරයක යුක්තියුක්ත ඉලක්කයක් ලෙස ද සැලකෙයි.

මැත මාස ගනනාව තුල, ජවිපෙ සහ හෙල උරුමය, දෙසැම්බර් 26 දා සුනාමියෙන් විපතට පත් ජනතාවට යලි ගොඩනැගීමේ ආධාර බෙදා හැරීම ඒකාබද්ධව කලමනාකරනය කරනු පිනිස කුමාරතුංග සහ එල්ටීටීඊය ගිවිසුමක් ඇති කර ගැනීමට එරෙහිව දුෂ්ට උද්ඝෝෂනයක් ගෙන ගොස් ඇත. ජූනි මස ජනාධිපති මෙම ගිවිසුම සඳහා අනුමැතිය දුන් කල ජවිපෙ පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් (එජනිස) ඉවත් විය. කදිරගාමර් ඝාතනයේ පටන් එල්ටීටීඊ විරෝධී උද්ඝෝෂන ව්‍යාපාර උත්සන්න කෙරී තිබේ.

වැල්ලවත්ත සුඩර් ඔලි කාර්යාලයට අත් බෝම්බ ප්‍රහාරය එල්ල වීමට දින දෙකකට පෙර පැවති ප්‍රසිද්ධ රැස්වීමක දී, මෙම පුවත් පත "කොටි ත්‍රස්තවාදීන්" සමග සමීප සබඳතා පවත්වා ගෙන යාම් සම්බන්ධයෙන් ජවිපෙ ප්‍රචාරක ලේකම් විමල් වීරවංශගේ හෙලා දැකීමට ලක් විය. කොලඹ පවත්නා වාර්ගික දේශපාලනයේ භාෂාවෙන් ගත් කල, ඔහුගේ ප්‍රකාශය සම වන්නේ, ප්‍රචන්ඩත්වය උසිගැන්වීමකට ය.

වැල්ලවත්ත ප්‍රහාරයට තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැතැයි ජවිපෙ කියා සිටියේ ය. තම සාමාජිකයන් පුවත් පතේ මාධ්‍යවේදියාට පහර නො දුන් බව පවසමින් ජවිපෙ වංචාකාරී නිවේදනයක් ද නිකුත් කර තිබේ. "මෙහි දී සිදු වී ඇත්තේ සැකකටයුතු ලෙස හැසිරුනු පුද්ගලයකුගේ අනන්‍යතාව පිරික්සීම" සහ ඔහු අසල සිටි පොලිස් නිලධාරින්ට භාර දීමක් පමනි.

ජවිපෙ නිවේදනය ඊලඟට එම පුවත් පතට එරෙහි රාජ්‍ය දඩයමක් උසිගැන්වීමට සම වන ඉල්ලීමක් ඉදිරිපත් කරයි: "සුඩර් ඔලි පුවත් පත යනු කොටි සංවිධානය වෙනුවෙන් ඍජුවම පෙනී සිටින පුවත් පතක් බව අමුතුවෙන් කිව යුතු නොවේ. සැකකටයුතු පුද්ගලයකු ආරක්ෂක අංශවලට භාර දුන් පසු ඔහු තම ආයතනයේ මාධ්‍යවේදියකු බවට පවසන සුඩර් ඔලි පුවත් පතේ ක්‍රියාකාරිත්වය ද සැකකටයුතු ය. එනිසා ඒ පිලිබඳව විධිමත් පරීක්ෂනයක් සිදු කරන ලෙස අපි ආරක්ෂක අංශවලින් ඉල්ලා සිටිමු."

පුලුල් විවේචනයන්ට ලක්ව සිටි ජවිපෙ, පුවත් පතේ ප්‍රධාන කාර්යාලයට එල්ල වූ මැත ම බෝම්බ ප්‍රහාරයෙන් අනතුරුව, තවත් නිවේදනයක් නිකුත් කලේ ය. "මෙම බියගුලු ප්‍රහාරය දැඩි පිලිකුලෙන් යුතුව " හෙලා දකින ජවිපෙ එම නිවේදනයෙන් අඩක් පමන මිඩංගු කොට තිබුනේ, සිය පක්ෂය සිද්ධියට කිසිදු සම්බන්ධයක් නැති බව ඔප්පු කිරීමේ ප්‍රයත්නයක් වෙනුවෙනි. ඔවුන් ඍජුව සම්බන්ධ වූවත් නැතත්, ජවිපෙ, සිය ප්‍රකෝපකාරී ප්‍රහාර හරහා, එවන් සාහසික ක්‍රියාවක් සිදු විය හැකි දේශපාලන වාතාවරනය නිර්මානය කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි.

මාධ්‍ය සංවිධාන ගනනාවක් ම සුඩර් ඔලි පුවත් පතට එල්ල වූ ප්‍රහාර හෙලා දැක ඇත. දේශ සීමාවලින් තොර වාර්තාකරුවෝ (ආර්එස්එෆ්) සංවිධානය නිවේදනයක් නිකුත් කරමින්, "ඕනෑ ම ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක අත්‍යවශ්‍ය අංග වන පුවත් පත් නිදහසට හා නිදහස් ප්‍රකාශනයට ගරු කරන ලෙස සියලු සන්නද්ධ දේශපාලන පක්ෂවලින් හා ව්‍යාපාරවලින්" ඉල්ලා සිටියේ ය. නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, මැත ම ප්‍රහාරය නම් කලේ," පුවත් පත් නිදහසට හා මාධ්‍ය විවිධත්වයට එරෙහි ප්‍රහාරයක්" ලෙස ය.

සුඩර් ඔලි කර්තෘ මන්ඩල කාර්යාලයේ ආරක්ෂක භටයා ඝාතනය කිරීම සම්බන්ධයෙන් පොලීසිය පරීක්ෂන පවත්වන නමුත් අපරාධකරුවන් අල්ලා ගැනීමට ඇති ඉඩකඩ අතිශයින් ම අඩු ය. ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවන් ද ජවිපෙ හා හෙල උරුමය ප්‍රකාශයට පත් කරන ගැඹුරට ම කා වැදුනු එම දෙමල විරෝධී අගතීන් තුල ම ගිලී පවතී.

මාස හතරකට ඉහත දී, ප්‍රමුඛ දෙමල මාධ්‍යවේදියකු වන ධර්මරත්නම් සිවරාම්, කොලඹ ජනාකීර්න වීදියක දී පැහැරගෙන ගොස් ඝාතනය කරන ලදි. එල්ටීටීඊයට පක්ෂපාතී *ටැමිල්නෙට්* වෙබ් අඩවියේ ජ්‍යෙෂ්ට කර්තෘ මන්ඩල සාමාජිකයකු වූ සිවරාම්, *ඩේලි මිරර්* ඉංග්‍රීසි පුවත් පතට ද ලිපි ලිවී ය. හෙල උරුමය මෙම ඝාතනයට ප්‍රශංසා කරමින් නිවේදනයක් නිකුත් කල අතර, "ටෙරපුත්තාභය බලකාය -" ලෙස තමන්ව හඳුන්වා ගත් කලින් දැන නොසිටි කන්ඩායමක් ඝාතනයේ වගකීම භාර ගති. පොලීසිය කිහිප දෙනෙකු අත් අඩංගුවට ගෙන ඇති නමුදු, කිසිදු සැකකරුවකුට එරෙහිව නඩු පවරා නැත.

අත් බෝම්බ ප්‍රහාරය හෙලා දැකීම සුඩර් ඔලි පුවත් පතට එරෙහි ප්‍රචන්ඩ ව්‍යාපාරය නතර කිරීමට සමත්ව නැත. අගෝස්තු 30 දා, පුවත් පතට සම්බන්ධට වාර්තාකරුවන් දෙදෙනෙක්, පාර්ලිමේන්තු රැස්වීම් ආවරනය කිරීමෙන් පසුව බස් රථයක් පැමිනෙන තෙක් බලා සිටින අවස්ථාවේ ප්‍රහාරයකට ලක් විය. ජවිපෙ, හෙල උරුමය සහ සෙසු පක්ෂ විසින් අවුලුවාලනු ලබන්නේ, ශ්‍රී ලංකාවේ අතීතයේ හටගත් භයංකර දෙමල විරෝධී ජනඝාතන ව්‍යාපාර යලි පුනර්කරනය විය හැකි වාතාවරනයකි.

© www.wsws.org